06. 2008 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ස්ථාන ලබාගත හැකි වේ දැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාසය තුළින් සුදුසු ගොඩනැගිලි සොයාගත යුතු අතර, එම ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශිය ලේකම් බැඳි නොමැති බැව් සැළකිය යුතුය.

07. කිසි කරුණක් නොදක්වාම එකක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශිය ලේකම්ට තිබේ.

08. අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තුව පහත උපලේඛනයේ දැක්වේ.

කේ. ජී. ධර්මතිලක,
ප්‍රාදේශිය ලේකම්,
කොළඹ.

2008 අගෝස්තු මස 05 වැනි දින,
කොළඹ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| (ඒ) | (බී) | (සී) | (ඩී) | (ඊ) | (එෆ්) | (ජී) | (එච්) |
|---|---|---|---|---|---|---|---|
| අනුක්‍රමික අංකය | ප්‍රදේශය | ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු) පෙදෙස) | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. | ටෙන්ඩරය භාරගන්නා අවසාන වේලාව | විකිණීම කරන දිනය |
| 1. | අංක 5 කොට්ඨාසය කොටහේන බටහිර (කොටබෝම්) | පෙදෙස මෙසේ සීමා වී තිබේ.- උතුරට : ස්කිනර් පාරේ දකුණු පෙදෙසේ සන්දියේ සිට කොටබෝම් වීදියේ සන්ධියට සහ ලැස්කැරින් වීදියේ සන්ධිය දක්වාත් ය. නැගෙනහිරට : ලැස්කැරින් වීදියේ සිට බටහිර පැත්ත ස්කිනර් පාරේ (දකුණු) සන්දියේ සිට පෙදෙස හා ජම්පටා විදිය, දකුණට : එහි සන්දියේ සිට ජම්පටා වීදියේ උතුරු පෙදෙස කොටබෝම් විදිය සහ ලැස්කැරින් විදියේ සන්දිය දක්වා පෙදෙස සහ බටහිරට : එකී සන්දියේ සිට කොටබෝම් වීදියේ නැගෙනහිර පෙදෙස ජම්පටා විදියේ සන්දියේ සිට ස්කිනර් පාර (උතුරට) සන්දිය දක්වා වූ පෙදෙසත්ය. | පෙ.ව. 11.00 සහ ප.ව. 5.00 | ප.ව. 2.00 සහ ප. ව. 8.00 | 5,000 | පෙ. ව. 10.30 | 2008.09.15 |
| 02. | අංක 5 කොට්ඨාසය කොටහේන බටහිර | එම සන්ධියේ සිට උතුරු ස්කිනර් පාරේ උතුරු පෙදෙස පිකරින් පාරේ සහ කොටහේන විදියේ සන්දිය දක්වා වූ පෙදෙස. | එම | එම | එම | එම | එම |
| 03. | (ස්කිනර් පාර) අංක 2 කොට්ඨාසය මෝදර | (ඒ) ඉහල වීදියේ ප්‍රදේශය ඇන්ඩෲ පෙදෙසේ සන්ධිය දක්වා අලුත් මාවත පාර සහ ශාන්ත ඇන්ඩෲ පාරේ සන්දිය දක්වා (බී) ශාන්ත ඇන්ඩෲ පාර පෙදෙසේ සන්දිය දක්වා ඉහල ශාන්ත ඇන්ඩෲ පෙදෙසේ සහ මාෂන් විදියේ සන්දිය දක්වා (සී) මෝදර වීදියේ ප්‍රදේශ සහ එහි සන්දිය දක්වා මාෂන් වීදියේ සහ මාදම්පිටිය පාරේ සන්දිය දක්වා (ඩී) ශාන්ත ජේම්ස් විදියේ දෙපස එහි සන්ධි දක්වා මෝදර වීදියේ සහ අලුත් මාවත පාරේ සන්දිය දක්වා (ඊ) අලුත් මාවත පාරේ දෙපස සහ එහි සන්දිය දක්වා, එහි පටුමග, සහ පහළ ශාන්ත ඇන්ඩෲ පෙදෙසේ, සන්දිය දක්වාත් ය. | එම | එම | එම | එම | එම |
| 04. | අංක 3 කොට්ඨාසය මාදම්පිටිය (පර්ගියුෂන් පාර) | ප්‍රදේශය මෙසේ සීමා වී තිබේ : උතුරට පර්ගියුෂන් පාර, දකුණ පෙදෙසේ සිට සන්දිය දක්වා සහ මට්ටක්කුලිය පල්ලිය පාරේ ගඟ දක්වා, නැගෙනහිරට ලූකස් පාරේ බටහිර පෙදෙසේ සිට සන්දිය දක්වා, පර්ගියුෂන් පාරේ සහ මාදම්පිටිය පාරේ සන්දිය දක්වා, දකුණට මාදම්පිටිය පාරේ උතුරු පෙදෙසේ සිට සන්දිය දක්වා ලූකස් පාරේ සන්දිය දක්වා. බටහිරට දානියෙල් පාරේ නැගෙනහිර පෙදෙසේ සිට සන්ධිය දක්වා මාදම්පිටිය පාරේ සහ ගිනමුල්ල පටුමගේ සන්දිය දක්වාත් ය. | එම | එම | එම | එම | එම |

| (ඒ) | (බී) | (සී) | (ඩී) | (ඊ) | (එෆ්) | (ජී) | (එච්) |
|---|---|---|---|---|---|---|---|
| අනුක්‍රමික අංකය | ප්‍රදේශය | ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු) පෙදෙස) | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. | ටෙන්ඩරය භාරගන්නා අවසාන වේලාව | විකිණීම කරන දිනය |
| 05. | අංක 3 කොට්ඨාසය මාදම්පිටිය | ප්‍රදේශය මෙසේ සීමා වී තිබේ : උතුරට පර්ගියුෂන් පාරේ දකුණු පෙදෙසේ සිට සන්දිය දක්වා ලූකස් පාරේ සහ නාගලගම් වීදියේ සන්දිය දක්වා, නැගෙනහිරට නාගලගම් විදියේ දකුණු පෙදෙසේ සිට සන්ධිය දක්වා පර්ගියුෂන් පාරේ සහ මාදම්පිටිය පාරේ සන්දිය දක්වා. දකුණට මාදම්පිටිය පාරේ උතුරු පෙදෙසේ සිට සන්දිය දක්වා නාගලගම් වීදියේ සහ ලූකස් පාරේ සන්දිය දක්වා බටහිරට ලූකස් පාරේ නැගෙනහිර පෙදෙසේ සිට සන්දිය දක්වා, මාදම්පිටිය පාරේ සහ පර්ගියුෂන් පාරේ සන්දිය දක්වාත් ය. | පෙ.ව. 11.00 සහ ප. ව. 5.00 | ප.ව. 2.00 සහ ප. ව. 8.00 | 5,000 | පෙ. ව. 10.30 | 2008.09.15 |

09. වැඩි විස්තර කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

10. වැදගත් .- 2008.09.15 වැනි දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් රේන්ද 2008.11.03 වැනි දින පෙ. ව. 10.30 ට නැවත විකුණනු ලැබේ.

08-677/1

---

## ජාඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

2009 ජනවාරි මස 01 දින සිට 2009 දෙසැම්බර් මස 31 දින දක්වා කාලය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2009 ජනවාරි මස 01 වැනි දින සිට 2008 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15%කට ලබාගත් වරිපනම් සහතිකයක් ද ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙලවරෙහි 'අංක................. දරන..................... රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය' යනුවෙන් පහත ලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2008.09.18 දින පෙ.ව. 10.30 ට පෙර ජාඇල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර ජාඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළවී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2008.09.18 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් ජාඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2008.11.06 දින පෙ.ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ජාඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යලෙයෙන් ලබාගත හැකිය.

ඩබ්. ඒ. විජිත ප්‍රේමප්‍රිය,
ප්‍රාදේශීය ලේකම්,
ජාඇල.

මගේ අංකය ඃ 1/1/7/2,
2008 අගෝස්තු 06 වැනි දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
ජාඇල.

**උපලේඛනය**

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර් භාරගන්නා අන්තිම දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල(රුපියල්)* |
|---|---|---|---|
| ජාඇල ප්‍රාදේශීය ලේකම් | කඳාන | 2008.09.18 දින පෙ.ව. 10.30 දක්වා | 1500.00 |
| එම | වැලිගම්පිටිය | එම | 1500.00 |
| එම | කණුවන | එම | 4000.00 |
| එම | ඒකල මෙගොඩ | එම | 5,000 0 |
| එම | දඬුගම | එම | 1,000 0 |

08-752

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම - 2009 වර්ෂය පින්නවල අංක 02 රා තැබෑරුම

2009 ජනවාරි මස 01 වැනි දින සිට 2009 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාල සීමාව තුළ මෙහි උපලේඛණයේ දැක්වෙන ප්‍රදේශයේ පැසුනු රා සිල්ලරට විකිණීම පිණිස ටෙන්ඩර් පත් කඳවනු ලැබේ.

මෙහි පහත සඳහන් කොන්දේසි වලට අනුකුල විය යුතුයි.

(1) 1982.02.20 වැනි දින අංක 207 දරණ ගැසට් පත්‍රයේ පළ කරණ ලද රා රේන්ද විකිණීමේ කොන්දේසි අනුව හා

(2) සුරා බදු නිවේදනයෙහි දැක්වෙන සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු කොන්දේසි මාලාවට යටත්වය.

2. සෑම ටෙන්ඩර් වෙනුවෙන් ම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක හෝ ලංකා බැංකු, දිස්ත්‍රික් ලේකම් ශාඛාවක මුදල් තැන්පත් කල බවට ලදුපතක් ටෙන්ඩරයට අමුනා එවිය යුතුය. පින්නවල අංක 02 තැබෑරුම සඳහා රු. 1500 ක් තැන්පත් කළ යුතුවේ.

3. ශ්‍රී ලංකාවේ සෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ද, කොළඹ සුරා බදු කාර්යාලයෙන් ද, ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍රයක ලියන ලද ටෙන්ඩර් පත්‍රය කවරයක බහා සීල් තබා එහි කෙළවරේ මුදුනේ 'පින්නවල අංක 02 රා තැබෑරුම සඳහා ඉදිරිපත් කරන ටෙන්ඩර්පත' බව පැහැදිලිව සඳහන් කළ යුතුය. ටෙන්ඩර් වැසීමට නියමිත කාලය ඉකුත් වීමට පෙර ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉඹුල්පේ යන ලිපිනයට එවිය යුතුය. නැතහොත් ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය.

4. සෑම ටෙන්ඩර්කරු වෙක්ම තමාගේ නමින්ම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

5. එක් අයෙකුට එක් තැබෑරුමක් සඳහා එක් ටෙන්ඩර්පතකට වඩා එවිය නොහැක. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට වැඩි අයවලුන් විසින් සාමුහිකව ටෙන්ඩර් ඉදිරිපත් කළ නොහැක.

6. ටෙන්ඩර්කරන මුදල ඉලක්කමෙන් සහ අකුරෙන් එවිය යුතුය. ටෙන්ඩරයේ කරන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුගේ අත්සන හා දිනය යොදා සහතික කළ යුතුය. සෑම ටෙන්ඩරයක්ම දෙදෙනෙකු විසින් ද අත්සන් කළ යුතුය. මෙම අවශ්‍යතාවයන්ට අනුකුල නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කල හැකිය.

7. ජයග්‍රාහී ටෙන්ඩර්කරු මිලදී ගත් තැනැත්තා හැටියට ප්‍රකාශ කල විගසින් රේන්ද විකිණීමේ කොන්දේසියට අත්සන් තබා ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල්, ඇප තැන්පත් වශයෙන් තැන්පත් කල යුතුය.

8. 2008 සැප්තැම්බර් මස 02 වෙනි අඟහරුවාදා පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ. ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. සෑම ටෙන්ඩර් කරුවෙක්ම එකී නියමිත වෙලාවට ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනි සිටිය යුතුය.

9. කිසිම හේතුවක් නොදන්වා ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ අභිමතය පරිදි ප්‍රතික්ෂේප කිරීමේ බලය ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම්ට පැවරී ඇත.

10. පූර්වෝක්ත දිනයේ විකිණීමට නොහැකි වූ තැබෑරුමක්, රේන්දයක් වෙතොත් ඒවා නැවත විකිණීම 2008.10.20 දින පෙ.ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

11. 2009 වර්ෂය සඳහා දැනට තැබෑරුම පවත්වාගෙන යනු ලබන ස්ථාන ලබා ගත හැකිදැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාල කොට්ඨාසය තුළ ගොඩනැගිලි සොයා ගත යුතු අතර එම ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගත යුතුවේ. ගොඩනැගිලි සොයා දීමට බලපත්‍ර අධිකාරිය බැඳී නොමැති බැව් සැලකිය යුතුය.

12. වැඩි විස්තර ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා දැන ගත හැකිය.

එම්. එම්. ගුණසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ඉඹුල්පෙ.

2008. 07. 30 වැනි දින,
ඉඹුල්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛණය**

| *තැබෑරුමේ නම සහ දිනය* | *කොට්ඨාසය* | *පිහිටි ප්‍රදේශය* | *තැබෑරුම විවෘත කරතැබිය යුතු වේලාවන්* | *ටෙන්ඩර් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* |
|---|---|---|---|---|
| අංක 02 පින්නවල රා තැබෑරුම | කඩවත කෝරළය | පින්නවල ගමතුළ | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා | 2008.09.02 වැනි දින |
| | | | ප.ව. 05.00 සිට ප.ව. 08.00 දක්වා | පෙ.ව. 10.30 දක්වා |

08-607

---

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 09 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත සමාගමක් ලෙස ලියාපදිංචි කළ බව දන්වමි.

සමාගමේ නම : සුන් ඩොං බයෝ ටෙක්නොලොජ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී. වී. 64799
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 4 - 4/1, රොක්වුඩ්ස් එපාර්ට්මන්ට්, රොක්වුඩ් ප්ලේස්, කොළඹ-07
සංස්ථාපිත දිනය : 2008.07.15

එස්. සී. යං,
අධ්‍යක්ෂ.

08-805

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ සංස්ථාපනය කරන ලද බව දන්වනු ලැබේ.

සමාගමේ නම : එස්. ඩී. ජී. ගුණසේකර (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 64520
ලියාපදිංචි දිනය : 2008 ජුනි මස 19 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 125/1, මගලෙගොඩ, වේයන්ගොඩ.

අධ්‍යක්ෂක මණ්ඩලය.

08-790

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (3) වගන්තිය යටතේ කෙරෙන දැන්වීමයි

තමන්කඩුව ඇග්‍රෝ ෆර්ටිලයිසර් කම්පැණි ලිමිටඩ් නමැති සමාගම සිලෝන් ෆර්ටිලයිසර් කම්පැණි ලිමිටඩ් නමැති සමාගම සමග ඒකාබද්ධ කිරීම.

තමන්කඩුව ඇග්‍රෝ ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ් නමැති සමාගම සිලෝන් ෆර්ටිලයිසර් කම්පැණි ලිමිටඩ් නමැති සමාගම සමග ඒකාබද්ධ කිරීම යථා පරිදි සම්පූර්ණ කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒකාබද්ධ කිරීම 2008 අගෝස්තු මස 1 වැනි දින සිට බලාත්මක වේ.

එස්. පී. මොරවක,
සමාගම් ලේකම්.

සිලෝන් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ් සමාගමේ
අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි.

08-792

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත කාණ්ඩ අංක 9 ප්‍රකාරව සෝලකින් සේරම් (ප්‍රයිවට්) ලිමිටඩ් 2008 ජුනි මස 24 වැනි දින ලියාපදිංචි කරන ලදී

සමාගමේ නම: සෝලකින් සේරම් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 64564
ලියාපදිංචි ලිපිනය : අංක 260/3, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත, කොළඹ 08

සමාගම් අධ්‍යක්ෂ.

08-762

---

## ඇටෝර්නි බලපත්‍රයෙන් මා දුන් බලය අවලංගු කිරීමයි

ඕස්ට්‍රේලියාවේ, වී. අයි. සී. රෝව්ලේ - 3178, මහොන්ගා ඩ්‍රයිව්, අංක 1 හි පදිංචිව සිට දැනට අළුබෝමුල්ල, බටදොඹතුඩුව පාරේ, අංක 276 හි පදිංචි, කළුආරච්චිගේ ඉන්ද්‍රතිලක පෙරේරා වන මම, පානදුර මහවිල, අංක 111 දරන ස්ථානයේ පදිංචි, කළුආරච්චිගේ නන්දිකා තිලකාවතී පෙරේරා යන අය මාගේ ඇටෝර්නි බලකාරිය වශයෙන් පත් කරමින් පියසේන අමරසිංහ ප්‍රසිද්ධ නොතාරිස් තැන වර්ෂ 1995 ක් වූ ඔක්තෝබර් මස 25 වැනි දින සහතික කළ අංක 9107 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් මා විසින් දෙන ලද ඇටෝර්නි බලය අවලංගු කරනු ලබන බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි. තවද එකී ඇටෝර්නි බලපත්‍රය යටතේ මින් ඉදිරියට මා වෙනුවෙන් ඇය විසින් කරනු ලබන කිසිදු කටයුත්තකට මම වග නොකියන බව වැඩි දුරටත් ප්‍රකාශ කරමි.

කලුආරච්චිගේ ඉන්ද්‍රතිලක පෙරේරා.

අංක 276,
බටදොඹතුඩුව පාර,
අලුබෝමුල්ල.

08-764

---

## ඇටර්නි බලය අවලංගු කිරීම ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පොල්ගස්ඕවිට සියඹලාගොඩ, වැලිහේනවත්ත, 181/82, දරන ස්ථානයේ පදිංචි කිරිහේන අප්පුහාමිලාගේ නිශාන්ත වන මම, ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ කොළඹ පාරෙහි පදිංචි සෙනරත් කලුආරච්චිගේ තුසිත තුසිල් සෙනරත් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද වර්ෂ 2002 ක්වූ සැප්තැම්බර් මස 02 වැනි දිනැති සහ අංක 229 දරන ඇටර්නි බලපත්‍රය මගින් එකී ශ්‍රී ලංකා ජනරජයේ, පොල්ගස්ඕවිට, සියඹලාගෙඩ, වැලිහේනවත්ත 181/82 දරන ස්ථානයේ පදිංචි කිරිහේන අප්පුහාමිලාගේ රාජ් ලක්ෂ්මන් නැමැති අයට ලබාදුන් ඇටර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලැබූ බව ශ්‍රී ලංකා ජනරජයත් සියලු මහජනතාවනුත් අන් සියලු දෙනාත් මෙයින් දැන ගනිත්වා.

එකී ඇටර්නි බලපත්‍රයේ සඳහන් ඇටර්නි බලකරු විසින් මෙදිනෙන් පසු මා වෙනුවෙන් කරනු ලබන ක්‍රියාවන් හෝ ගණුදෙනු සම්බන්ධයෙන් මා විසින් කිසිදු වගකීමක් භාරගනු නොලබන බව ද, සියලු දෙනාම මෙයින් දැන ගනිත්වා.

කිරිහේන අප්පුහාමිලාගේ නිශාන්ත.

08-765

## සාමාන්‍ය දැන්වීමයි

පහත විස්තර කර ඇති පරිදි 2007 අංක 7 දරන නව සමාගම් පනතේ, 9 වැනි ජේදයේ, අනු ජේද 01 ට අනුව පහත සඳහන් සමාගම් අට නීත්‍යානුකූලව සමාගම් ලෙස ලියාපදිංචි කළ බව මෙයින් දන්වා සිටිමි.

| *සමාගම් නාමය* | *සමාගම් අංකය/දිනය* | *ලියාපදිංචි කාර්යාලීය ලිපිනය* |
|---|---|---|
| 1. ට්‍රාන්ස් ගල්ෆ් (කුරුණෑගල) ඒජන්සි පෞද්ගලික සමාගම | පීවී 61253<br>2007 සැප්තැම්බර් 4 | මුණසිංහ පුඩ් කෝට් ගොඩනැගිල්ල,<br>අංක 21, 2 වැනි මහල, මලියදේව පාර, කුරුණෑගල |
| 2. ප්‍රොජෙක්ට් ඩේටා සර්විසස් පෞද්ගලික සමාගම | පීවී 64711<br>2008 ජූලි 04 | අංක 32/3, දුම්රිය පොළ මාවත, කොළඹ 05 |
| 3. ස්ටැලියන් කොමොඩිටීස් පෞද්ගලික සමාගම | පීවී 64712<br>2008 ජූලි 04 | අංක 100/9, නිදහස් මාවත,<br>කොළඹ 07 |
| 4. මල්ෆානි පෞද්ගලික සමාගම | පීවී 64713<br>2008 ජූලි 04 | අංක 514/1, රෝහල් පාර, හෝමාගම |
| 5. වී. එම්. එෆ්. ඇසෝෂියේට්ස් පෞද්ගලික සමාගම | පීවී 64714<br>2008 ජූලි 04 | අංක 16, ද සිල්වා විදිය<br>කළුතර දකුණ |
| 6. අරියානා පෞද්ගලික සමාගම | පීවී 64715<br>2008 ජූලි 08 | අංක 78, ෂූ පාර,කොටහේන<br>කොළඹ 13 |
| 7. ඩයිනමික් ඒ වී ටෙක්නොලොජිස් පෞද්ගලික සමාගම | පිවී 64937<br>2008 ජූලි 24 | අංක 100/9, 3 වැනි මහල,<br>නිදහස් මාවත, කොළඹ 07 |
| 8. වේගා ටෙක්නොලොජිස් පෞද්ගලික සමාගම | පීවී 64998<br>2008 ජූලි 29 | අංක 3 - 1/1, හාර්මර්ස් මාවත<br>කොළඹ 06. |

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි සමාගම් ලේකම්වරු.

මැන්සෙක් සර්විසස් පෞද්ගලික සමාගම- පීවී 6, 6ජ්, 6සී ඩේසි විලා මාවත,
බම්බලපිටිය, කොළඹ 04.
දුරකථන අංක : 2597911/2597910.

08-603

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මාරවිල, පල්ලිය පාර, 'කමලා සෙවන', දරන ස්ථානයේ පදිංචි වැලිගම පලල්ලපල්ලිය ගුරුගේ ජයරත්න වන ම විසින් ඩී. එච්. එච්. ජයසිංහ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කළ අංක 3543 හා 1999.02.24 දිනැති ඇටෝර්නි බලපත්‍රයෙන් ඉහත ලිපිනයේ ම පදිංචි කැකුල්තොටුවගේ දෝන ලූඩ්ස් ග්‍රීටා රෝහිණීට ලබා දී ඇති ඇටෝර්නි බලය අවලංගු කරන ලද බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි.

වැලිගම පලල්ලපල්ලිය ගුරුගේ ජයරත්න.

08-700

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

පොල්ගස්ඕවිට, මත්තේගොඩ අංක 152/1 දරන ස්ථානයේ පදිංචි උතුවන දනාගම ගෙදර ප්‍රියන්ත රණසිංහ වන ම විසින් ඉ. ග. අබේසිංහ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කළ අංක 7931 හා 2002.08.30 දිනැති ඇටෝර්නි බලපත්‍රයෙන් ඉහත ලිපිනයේ ම පදිංචි මහරන්සිරිගේ සීතා ප්‍රියංගනීට ලබා දී ඇති ඇටෝර්නි බලය අවලංගු කරන ලද බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි.

උතුවන දනාගම ගෙදර ප්‍රියන්ත රණසිංහ.

08-701

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගාල්ල දිස්ත්‍රික්කයේ, හික්කඩුව, හෙට්ටිගොඩ, ශ්‍රී සුමංගල පාර, අංක 34 දරන ස්ථානයෙහි පදිංචි ලොකුගේ සන්ධ්‍යා දයාලි ආරියසිරි වන මා විසින් ගාල්ල, කන්දෙවත්ත දෙවන පටුමග, අංක 13/3, දරන ස්ථානයෙහි පදිංචි ලොකුගේ උදේනිකා ශ්‍යාමලී ආරියසිරි යන අය වෙත ප්‍රදානය කරන ලද ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් බී. ජී. ඩබ්ලිව්. ලයනල් මහතා විසින් ලියා සහිතක කරන ලද වර්ෂ 2008 ක් වූ අප්‍රේල් මස 24 වැනි දිනැති අංක 1851 දරන ඇටෝර්නි බලපත්‍රය වහාම බලපැවැත්වෙන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන ලද බවත්, එකී ලොකුගේ උදේනිකා ශ්‍යාමලී ආරියසිරි විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මින් ඉදිරියට මා වග නොකියන බවත්, ඒ හා සම්බන්ධ කිසිදු වගකීමකට නොබැඳෙන බවත් ප්‍රකාශ කර සිටිමි.

ලොකුගේ සන්ධ්‍යා දයාලී ආරියසිරි.

08-702

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය අනුව කරණු ලබන දැන්වීම

නම : පාලිත පැකේජින් පෞද්ගලික සමාගම
අංකය : පී. වී. 61372
ලිපිනය : අංක 30, ජෝර්ජ් ඊ. ද සිල්වා මාවත, මහනුවර.

කේ. ඒ. එච්. එම්. කොඩිතුවක්කු,
ලේකම්.

08-605

---

### ඇටර්නි බලය අවලංගු කිරීම

කොළඹ 03, 5 වන පටුමග, අංක 91/බී හි පදිංචි, ගාමිණී නිශ්ශංක අමරසූරිය (ජා. හැ. අංක 252730214 V) වන මා බිබිල, මඩකලපුව පාර, තානායම ඉදිරිපිට පදිංචි කුඩා වීදානගේ ටැට් ද සිල්වා වෙත පවරන ලද ප්‍රසිද්ධ නොතාරිස් රන්ජනි නඩරාජන් මහත්මිය විසින් ලියා සහතික කල අංක 45 සහ වර්ෂ 1990 ජූලි මස 07 වැනි දිනැති ඇටර්නි බලපත්‍රය අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. මින් ඉදිරියට කේ. වී. ටැට් ද සිල්වා මා වෙනුවෙන් කරනු ලබන කිසිම ගණුදෙණුවකට මා වග නොකියන බව ද මින් දන්වා සිටිමි.

08-628

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) යටතේ නිවේදනය

සමාගමේ නම : ජුවෙල් කුඩ්සි ප්‍රයිවට් ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 64787
සංස්ථාගත කළ දිනය :2008 ජූලි මස 10 වැනි දින
ලියාපදිංචි ලිපිනය : අංක 46 - බී, ගාලු පාර, කොළඹ 03.

08-626

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

නුගේගොඩ, ස්ටැන්ලි තිලකරත්න මාවතේ, අංක 134/3 'ඊ' හි පදිංචි එදිරිමුනි විජිත තේජලාල් ද සිල්වා වන මා විසින් නුගේගොඩ, නාවල පාර අංක 130/9 හි පදිංචි සෙල්ලප්පෙරුමගේ සේන රංජිත් ප්‍රනාන්දු යන අයට ප්‍රදානය කරන ලද ඩබ්ලිව්. කේ. ජී. ජයසේකර ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලද අංක 912 සහ 1991 ඔක්තෝබර් 10 වෙනි දින දරන ඇටෝර්නි බලපත්‍රය වර්ෂ 2008ක් වූ ජූලි 30 වෙනි දින සිට මේ නිවේදනය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලබන බවත්, එසේම ඉහත කී සෙල්ලප්පෙරුමගේ සේන රංජිත් ප්‍රනාන්දු යන අය විසින් මා වෙනුවෙන් මින් මතුවට කරනු ලබන කිසිම ගණුදෙනුවකට මා වගකීමකින් බැඳී නොසිටින බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවට සහ පොදු ජනතාවට මෙයින් දැනුම් දෙමි.

එදිරිමුනි විජිත තේජලාල් ද සිල්වා.

08-597

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) දරන ඡේදය යටතේ

සමාගමේ නම : විහාවි හයිඩ්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 64740
සංස්ථා ගත කළ දිනය : 2008 ජූලි මස 07 වැනි දින
කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය : 40, කලවැල්දෙණිය පාර, අඩ්ට් නෝර්ටන් බ්‍රිජ්

ලේකම්වරුන්.

08-688

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) දරන ඡේදය යටතේ

සමාගමේ නම : සී. පී. සී. ෆුඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 64761
සංස්ථා ගත කළ දිනය : 2008 ජූලි මස 09 වැනි දින
කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය : 136,ෆරන්සවත්ත පාර, කොළඹ15.

ලේකම්වරුන්.

08-687

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) දරන ඡේදය යටතේ

සමාගමේ නම : විහවි හයිඩ්‍රෝ ජෙනරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 64737
සංස්ථා ගත කළ දිනය : 2008 ජූලි මස 07 වැනි දින
කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය : 40, කලවැල්දෙණිය පාර, අඩ්ට් නෝර්ටන් බ්‍රිජ්.

ලේකම්වරුන්.

08-686

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) දරන ඡේදය යටතේ

සමාගමේ නම : උහන සස්ටේනබල් ඇග්‍රිකල්චර් රිසෝස් සෙන්ටර් ලිමිටඩ්
සමාගමේ අංකය : පීබී 3549
සංස්ථා ගත කළ දිනය : 2008 ජූලි මස 10 වැනි දින
කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය : 9/67, සියඹලා වැව, උහන.

ලේකම්වරුන්.

08-685

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) දරන ඡේදය යටතේ

සමාගමේ නම : පී. යූ. පෘඝඩන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 64738
සංස්ථා ගත කළ දිනය : 2008 ජූලි මස 07 වැනි දින
කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය : 526,හයිලෙවල් පාර, දෙල්කඳ, නුගේගොඩ.

ලේකම්වරුන්.

08-689

---

**2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කෙරෙන නිවේදනය**

සව්සිරි ෆාමසි ප්‍රයිවට් ලිමිටඩ් 2008 ජූලි මස 10 වැනි දින ලියාපදිංචි අංක පීවී 64782 යටතේ සංස්ථාපිතය.

ලියාපදිංචි ලිපිනය : අංක 257 බී, රිච්මන්ඩ් හිල් පාර, ගාල්ල.

ජේ. කදිරහෙට්ටිආරච්චි
ලේකම්.

08-718

---

**සීමාසහිත සමාගමක් නම වෙනස් කර ස්ථාපිත කිරීම**

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ අංක 7 දරන පනතේ 9 (2) වන ජේදය අනුව මහජනයා වෙත කරන නිවේදනයයි.

සමාගමේ අළුත් නම : සිල්වරෝයල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ පූර්ව නම : සිල්වරෝයල් (කළම්බු) (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී. වී. 3027
ලියාපදිංචි ලිපිනය : අංක 18, චාල්ස් ඩ්‍රයිව්, කොළඹ 3.

08-748

---

**2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) ට අනුව සමාගමේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දන්වන ප්‍රසිද්ධ දැන්වීම

සමාගමේ නම : ඒ සී ඒ ඩිජිටල් කොම් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 65051
සංස්ථාපනය කළ දිනය : 2008 අගෝස්තු මස 04 වැනි දින
සමාගම ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 34, 35, 2 වැනි නව නගර සංකීර්ණය, කොළඹ 11.

සමාගමේ ලේකම්,
ජේ ඇන්ඩ් ඒ මැනේජ්මන්ට් සිස්ටම්ස් පෞද්ගලික සමාගම.

අංක 96 - 2/7, කන්සිස්ටරි බිල්ඩිම, මල්වත්ත පාර, කොළඹ 11.
දුරකථන අංක : 011- 4614887/011- 4737315.

08-747

---

**2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ වගන්ති 9(1) ට අනුව සමාගමේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දන්වන ප්‍රසිද්ධ දැන්වීම.

සමාගමේ නම : මාස්ටර් බිල්ඩර්ස් ඉන්ජිනියරින් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 65027
සංස්ථාපනය කළ දිනය : 2008 අගෝස්තු මස 01 වැනි දින
සමාගම ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 125/3, 2/3, කොමන් පාර, අක්කරෙයිපත්තු - 2.

සමාගමේ ලේකම්,
ජේ ඇන්ඩ් ඒ මැනේජ්මන්ට් සිස්ටම්ස් පෞද්ගලික සමාගම.

අංක 96 - 2/7, කන්සිස්ටරි බිල්ඩිම, මල්වත්ත පාර, කොළඹ 11
දුරකථන අංක : 011-4614887/011-4737315.

08-746

---

වර්කර්බී (ප්‍රයිවෙට්) ලිමිටඩ් 2008.07.23 වැනි දින සංස්ථාගත කළ බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : වර්කර්බී (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 64912
ලියාපදිංචි කාර්යාලය : 70/10, සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මාවත, කොළඹ 07.

කේ. ජී. ඩී. එස්. සී. ගුණසේකර,
සමාගම් ලේකම්.

08-744

---

**ගැසට් නිවේදනය පළකල යුතු දැන්වීම**

සමාගමක් ලියාපදිංචි කිරීමේ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය පරිදි, පහත සඳහන් සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2008 ජුනි 30 වැනි දින ලියාපදිංචි කල බව මහජනතාව වෙත මෙයින් දන්වමු.

සමාගමේ නම : ලංකා ඉන්ටනැෂනල් නේචර් ලවින් ස්කූල්
ලියාපදිංචි අංකය : පී. වී. 64645
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : ඩී. අජිත් විජේසිංහ, අංක 15/3, 3 වැනි පටුමග, අඟුලාන දුම්රිය පළ පාර, මොරටුව.
සමාගම් අධ්‍යක්ෂක : ඩී. අජිත් විජේසිංහ
සමාගම් ලේකම් : නදීෂා ප්‍රියදර්ශනී ජයලත්

08-753

# රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

**2009 වර්ෂය සඳහා රට බීම තැබෑරුම් රේන්ද විකිණීම - කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රජයෙන් අනුමත කරන ලද පහත සඳහන් එක් එක් ප්‍රාදේශික ප්‍රදේශයන්හි සුදුසු ස්ථානයක 2009 ජනවාරි මස 01 වැනි දින සිට 2009 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව රටබීම (මෙරට සාදන ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

(i) 1982.08.20 වැනි දින හා අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පෙනෙන රටබීම තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි,

(ii) සුරාබදු බලපත්‍ර සම්බන්ධව දැනට පවතින පොදු කොන්දේසි.

02. කොළඹ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි නියමිත ආකෘති මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ පහත පෙනෙන 'එෆ්' තීරයේ එක් එක් තැබෑරුමට කෙළින් දක්වා තිබෙන නියමිත මුදල් තැන්පත් කළ බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රාදේශීය ලේකම්වරයෙකුගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමගය. ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතික, එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේ ම එම සහිතකය නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම් එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු පහක කාලයක් සඳහා වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර, වත්කම් සහතික වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හි දී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගු වන අලුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය. එසේ නැත්නම් රේන්ද කාලය අවසානය දක්වා ඇති ඉතිරි කාලය සඳහා අතිරේක වත්කම් සහතිකයක් වලංගු කාලය අවසන්වීමට යටත් පිරිසෙයින් මසකට පෙර ඉදිරිපත් කළ යුතුය.

03. කවරයක බහා මුද්‍රා තබන ලද එක් එක් ටෙන්ඩර් පත්‍රය ඇතුළත් කවරයෙහි උඩ වම් කෙළවරේ '2009 වර්ෂයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක............................. දරන රටබීම තැබෑරම සඳහා ටෙන්ඩර් පත්‍රය' යි යන්න සඳහන් ටෙන්ඩර් පත්‍ර, තැබෑරුමේ නමට කෙළින් පහත දක්වා තිබෙන වේලාවන් සහ දිනයන් හි දී ලැබෙන සේ කොළඹ ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතුය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාරගන්නා අවසන් වේලාවේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතුයි.

04. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේම ගැණුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, ඉහත පෙනෙන රට බීම රේන්ද විකිණීමේ කොන්දේසි ප්‍රකාර විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදල තැන්පත් මුදල වශයෙන් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතුය.

05. සාර්ථක ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් යථා කල්හි තැන්පත් කිරීම හෝ පැහැර හැරියොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වන අතර ඔහුගේ ම නම වරදකරුවෙකු වශයෙන් සුරාබදු බලපත්‍රකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමට පුළුවන. සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් හෝ සම්පූර්ණ ඇප මුදල තැන්පත් කර විකිණීමේ කොන්දේසි අඩංගු ගිවිසුම අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

06. කිසි කරුණක් නොදක්වාම එකක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්ට තිබේ.

07. 2008 වර්ෂය සඳහා දැනට විදේශීය මත්පැන් තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ස්ථාන ලබාගත හැකි වේ දැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාසය තුළින් සුදුසු ගොඩනැගිලි සොයාගත යුතු අතර, එකී ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැලකිය යුතුය.

08. අනුමත කරන ලද රටබීම තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ.

**උපලේඛනය**

| *(ඒ)* අනුක්‍රමික අංකය | *(බී)* කොට්ඨාසය | *(සී)* ප්‍රාදේශීය බල ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) | *(ඩී)* තැබෑරුම විවෘත කරන වේලාව | *(ඊ)* තැබෑරුම වසන වේලාව | *(එෆ්)* ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. | *(ජී)* ටෙන්ඩරය භාරගන්නා අවසාන වේලාව | *(එච්)* විකිණීම කරන දිනය |
|---|---|---|---|---|---|---|---|
| 1. | අංක 13 කොට්ඨාසය කොටුව | (ඒ) ක්වීන් වීදියේ සහ යෝක් වීදියේ සන්ධිය දක්වා එම සන්ධිය සිට වූ බේලි වීදිය පෙදෙස<br>(බී) කැනල් රෝ සහ චර්ච් සන්ධිය දක්වා එම සන්ධියේ සිට වූ යෝක් වීදියේ බටහිර පෙදෙස<br>(සී) යෝක් වීදියේ සහ ප්ලැග්ස්ටොප් වීදියේ සන්ධිය දක්වා එම සන්ධිය සිට වූ චැතැම් වීදියේ දෙපස පෙදෙස, චර්ච් වීදියේ සහ චැතැම් වීදියේ සන්ධිය දක්වා එම සන්ධිය සිට වූ ක්වීන් වීදියේ නැගෙනහිර පෙදෙස | පෙ.ව. 11.00 සහ ප.ව. 5.00 | පෙ.ව. 2.00 සහ ප.ව. 8.00 | 5,000 | පෙ.ව. 10.30 | 2008.09.15 |
| 2 | අංක 2 කොට්ඨාසය මෝදර | *පෙදෙස මෙසේ සීමා වී තිබේ.- උතුරට :* අලුත් මාවත පාරේ සහ මෝදර වීදියේ සන්ධිය දක්වා ද, එම සන්ධියේ සිට මාදම්පිටිය පාරේ දකුණු පෙදෙස ද, නැගෙනහිරට : පහළ ශාන්ත ඇන්ඩෲගේ පෙදෙසේ සහ මාදම්පිටිය පාරේ සන්ධිය දක්වා ද, එම සන්ධියේ සිට අලුත් මාවත පාරේ බටහිර පෙදෙස ද, දකුණට : ශාන්ත ඇන්ඩෲගේ පාරේ සහ අලුත් මාවත පාරේ සන්ධිය දක්වා ද, එම සන්ධියේ සිට පහළ ශාන්ත ඇන්ඩෲගේ පෙදෙසේ උතුරු පෙදෙසද, බටහිර මාලේ වීදියේ සහ පහළ ශාන්ත ඇන්ඩෲගේ පෙදෙසේ සන්ධිය දක්වා ද, එම සන්ධියේ සිට ශාන්ත ඇන්ඩෲ පාරේ නැගෙනහිර පෙදෙස සහ මාදම්පිටිය හා මාලේ වීදියේ සන්ධිය දක්වා එම සන්ධියේ සිට වූ මෝදර වීදිය නැගෙනහිර පෙදෙසත්ය. | පෙ.ව. 11.00 සහ ප.ව. 5.00 | ප.ව. 2.00 සහ ප.ව. 8.00 | 5.000 | පෙ.ව. 10.30 | 2008.09.15 |

09. වැඩි විස්තර කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැක.

10. වැදගත් .- 2008.09.15 වැනි දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් රේන්ද 2008.11.03 වැනි දින පෙ.ව. 10.30 ට නැවත විකුණනු ලැබේ.

කේ. ජී. ධර්මතිලක,
ප්‍රාදේශීය ලේකම්,
කොළඹ.

2008 අගෝස්තු මස 05 වැනි දින,
කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-677/2

**කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය මහලේකම් කොට්ඨාශයේ විදේශීය මත්පැන් රේන්දය විකිණීම-2009 වර්ෂය**

2009 ජනවාරි මස 01 දින සිට 2009 දෙසැම්බර් මස 31 දින දක්වා විදේශීය මත්පැන් සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වෙනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලට හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළ එවකට පවත්වන කොන්දේසි මාලාවට යටත් ව පහත උපලේඛනයේ විස්තර දැක්වෙන විදේශීය මත්පැන් තැබෑරුම් සඳහා ටෙන්ඩර් 2008.10.03 වෙනි දින පෙ.ව. 10.30දක්වා නිකුත් කරනු ලැබේ.

**අංක 01. හොරණ විදේශීය මත්පැන් තැබෑරුම**

02. *(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල වෙනුවෙන් රු. 3,000ක් ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමග සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත් නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍ර මගින් දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතුය. 2008.10.02 වෙනි දින ප.ව. 3.00ට වේලාව දක්වා ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපල පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ටෙන්ඩර් පත්‍රයට අමුණා තිබිය යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත විදේශීය මත්පැන් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිලිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත නිවේදනය කෙරේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතුයඃ-

(i) ටෙන්ඩර්පත්‍ර මුළුමනින් ම සම්පූර්ණ කලයුතුය. සඳහන් කරන මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවීම කළ යුතුය.
(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පෝරම වල නියමිත පරිදි සාක්ෂිකරුවන්ගේ අත්සන යොදා ඔවුන්ගේ ලිපිනයන්ද සඳහන් කර තිබිය යුතුය.
(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කර තිබිය යුතුය.

මෙම නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින් ඉදිරිපත් කල යුතු අතර, නියෝජිතයෙකු විසින් හෝ ලාංකික නොවූ හෝ 1982.08.20 දින අංක 207 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද විදේශීය මත්පැන් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුසු අයගෙන් හෝ ටෙන්ඩර්පත්‍ර භාරගනු නොලැබේ.

04. තැබෑරුම වෙනුවෙන් එක් අයකුට එක් ටෙන්ඩර් පත්‍රයකට වඩා ඉදිරිපත් කළ නොහැකි අතර, පවුලේ සාමාජිකයන් එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට වඩා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කල නොහැකිය.

05. සෑම ටෙන්ඩරයක්ම කවරයක බහා සීල් තබා කවරයෙහි වම් කෙළවරේ 'අංක 01 හොරණ විදේශීය මත්පැන් තැබෑරුම් ටෙන්ඩරය 2009' යනුවෙන් පැහැදිලිව සටහන් කල යුතුය. විධිමත්ව සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් සහිත කවර -

*(අ)* හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ,

*(ආ)* ලියාපදිංචි තැපෑලෙන් එවන්නේ නම් 2008.10.03 වැනි දින පෙ.ව. 10.30 වේලාවට පෙර කාර්යාලයට ලැබෙන සේ ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය හොරණ යන ලිපිනයට එවිය යුතුය. ඉහත සඳහන් වේලාවෙන් පසුව තැපෑලේදී ප්‍රමාද වී කාර්යාලයට ලැබෙන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එම වේලාවට සියළුම ටෙන්ඩර්කරුවන් හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයට පැමිණ සිටිය යුතුය. මෙහි 3 වන ඡේදයේ සඳහන් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුස්සෙකු නොවන බව ඔප්පු කිරීමට අවශ්‍ය වුවහොත් ඊට උවමනා ලියකියවිලි ද රැගෙන ආ යුතුය.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බැව් දැන්වූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා හොරණ ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරනු ලබන මුදලක් ද ගෙවිය යුතුය.

07. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර කිසිම හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය හොරණ ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත. රේන්ද විකිණීමේ කොන්දේසිවලට අනුකූල නොවන හෝ වෙන යම් අන්දමකින් නිසි පරිදි සකස් කර ඉදිරිපත් නොවූ හෝ ටෙන්ඩර් බාර ගනු නොලැබේ.

08. 2009 වර්ෂයට දැනට තැබෑරුම් පිහිටා ඇති ස්ථානය ලබාදීමට සහතික වනු නොලැබේ. දැනට විදේශීය මත්පැන් තැබෑරුම පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල මොනයම් හේතුවක් නිසා හෝ 2009 වර්ෂය වෙනුවෙන් එම කාර්යය සඳහා නොලැබෙන්නේ නම් ඒ වෙනුවට තෝරා ගන්නා ලද අළුත් ස්ථානය විවෘත කිරීමට පෙර යෝග්‍යතාවය පිළිබඳව හොරණ ප්‍රාදේශීය ලේකම් ගේ අනුමැතිය ලබාගත යුතු අතර, ටෙන්ඩර් ප්‍රදානය කල දින සිට දින 30 ඇතුලත සාර්ථක ටෙන්ඩර්කරු විසින් එම ගොඩනැගිල්ල අනුමත කරවා ගත යුතුය.

09. වැඩි විස්තර හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් දැනගත හැකිය.

10. මෙම දැන්වීම අනුව 2008.10.03 දින දී මෙම රේන්දය විකිණීමට නොහැකි වුවහොත් පමණක් 2008.10.17 දින පෙ.ව. 10.30 දක්වා විකිණීම පිණිස ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන බවද එසේම නැවත විකිණීම ද 2008.10.17 වැනි දිනයේ දී සිදුකරන බවද වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. ඩී. ආර්. නිශාන්ති ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
හොරණ.

2008 ජූලි මස 30 වැනි දින,
හොරණ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

**හොරණ අංක 01 දරන විදේශ මත්පැන් තැබෑරුම් රේන්දය විකිණීම**

**උපලේඛනය**

| *අනු අංකය* | *කොට්ඨාශයේ නම* | *ප්‍රාදේශීය ප්‍රදේශය* | *තැබෑරුම විවෘත කරන වේලාවන්* | *තැබෑරුම වසන වේලාවන්* | *තැබෑරුම් රේන්දය විකිණීමට ටෙන්ඩරය භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. සත* | *2008.10.03 දිනදී විකිණීමට නොහැකි වුවහොත් නැවත විකිණීමේ දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|---|
| 01 | හොරණ | හොරණ නගර සභා සීමාව | පෙ.ව.9.00 | ප.ව. 11.00 | 2008.10.03 පෙ.ව. 1.0.30 | රු. 3,000 | 2008.10.17 පෙ.ව.10.30 |

08-611

---

**රටබීම තැබෑරුම් සඳහා රේන්ද විකිණීම - 2009 මොරටුව**

රජයෙන් අනුමත කරන ලද පහත සඳහන් ප්‍රාදේශීය ප්‍රදේශයන්හි සුදුසු ස්ථානයක 2009 ජනවාරි 01 වැනි දින සිට 2009 දෙසැම්බර් 31 දින දක්වා තනි අයිතිය පිට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව රටබීම (මෙරට සාදන ලද ධාන්‍ය මත්පැන් ඇතුලුව) විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

1. 1982.08.20 දින හා අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රටබීම තැබෑරුම් රේන්ද විකිණීම් කොන්දේසිය
2. සුරාබදු බලපත්‍ර සම්බන්ධව දැනට පවතින පොදු කොන්දේසි

02. පහත දැක්වෙන ස්ථානයන්ගෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍ර මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ, රු.5,000 ක මුදලක් තැන්පත් කළ බවට ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද, සමගය. ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද, එම සහතිකයන්හි උපලේඛනයේ ඇතුලත්. එසේම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම්, එම වත්කම් සහතිකය නිකුත් කළ දින සිට අවුරුදු පහක් වලංගුවේ. රේන්ද කාලය අවසන් වීමට පෙර වත්කම් සහතිකය වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හිදී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගු වන අලුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය.

(ඒ) ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින්,
(බී) කොළඹ 2, ස්ටේප්ලර් වීදිය, සුරාබදු කාර්යාලයෙන්
(සී) කොළඹ සුරාබදු මණ්ඩල කාර්යාලය.

03. කවරයක බහා මුද්‍රා තබන ලද එක් එක් ටෙන්ඩර් පත්‍රය ඇතුලත් කවරයේ උඩ වම් කෙළවරේ මෙසේ සඳහන් කළ යුතුය. '2009 වර්ෂයේ මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 9 දරන රටබීම තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රයයි' ටෙන්ඩර් පත්‍ර 2008.09.16 දින පෙ.ව. 10.30ට පෙර ලැබෙන සේ මොරටුව ප්‍රාදේශීය ලේකම්තුමාට එවිය යුතුය.

ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාරගන්නා අවසන් වේලාවේදී මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතුය.

04. තෝරාගත් ටෙන්ඩර්කරු, ඒ මොහොතේම, ගැනුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, නියම කරනු ලබන මුදල තැන්පත් ඇප මුදල වශයෙන් මොරටුව ප්‍රාදේශීය ලේකම්තුමාට ගෙවිය යුතුය.

05. සාර්ථක ටෙන්ඩර්කරුට, ඔහුගේ ටෙන්ඩර් පත්‍රය, පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් යථා කාලයේදී තැන්පත් කිරීම හෝ පැහැර හැරියහොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල් අහිමි වන අතර, ඔහුගේ නම වරදකරුවෙකු වශයෙන්, සුරාබදු බලපත්‍ර කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් හෝ සම්පූර්ණ ඇප මුදල තැන්පත් කර විකිණීමේ කොන්දේසි අඩංගු ගිවිසුම අත්සන් කළ පසු, ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

06. කිසි හේතුවක් නොදක්වාම, එකක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්තුමාට ඇත.

07. මෙම විදේශ මත්පැන් තැබෑරුම්, කොට්ඨාශ අංක 9 හි පවත්වාගෙන යා යුතුය. සාර්ථක ටෙන්ඩර්කරු විසින් කොට්ඨාශය තුළින් සුදුසු ගොඩනැගිල්ලක් සපයා ගතයුතු අතර, එකී ගොඩනැගිල්ල සඳහා සුරාබදු කොමසාරිස් අනුමැතිය ලබාගත යුතුවේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැලකිය යුතුය.

08. අනුමත කරන ලද රටබීම තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ.

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | ප්‍රාදේශීය ප්‍රදේශය තැබෑරුම් අයත් විය යුතු පෙදෙස | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල් | ටෙන්ඩරය භාරගන්නා අවසන් වේලාව | විකිණීම කරන දිනය |
|---|---|---|---|---|---|---|---|
| 1 | නො. 9 කොට්ඨාශය මොරටුව මහ නගර සභාව | මොරටුව මහ නගර සභාවේ නො. 9 කොට්ඨාශයේ ගාලු පාරේ, බටහිර පෙදෙසේ, පිහිටි මොරටුවැල්ල ගමේ පමණක්. | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව.8.00 | 5,000 | පෙ.ව.10.30 | 2008 සැප්.16 |

09. වැඩි විස්තර මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

10. වැදගත් 2008.09.16 වැනි දින විකිණීමට නොහැකි විදේශීය මත්පැන් රේන්ද 2008.11.04 වැනි දින පෙ.ව. 10.30ට නැවත විකුණනු ලැබේ.

බී. කේ. සෝමපාල,
ප්‍රාදේශීය ලේකම් - මොරටුව.

2008.08.
මොරටුව,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-682

---

**සංශෝධනයයි**

අඹගමුව කෝරළයේ 2009 වර්ෂයේ රා සහ විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම

2008 අගෝස්තු මස 15 වැනි දින අංක 1563 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* I කොටස : II ආ ජේදයෙහි රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත් යටතේ පළ වූ, අංක 540 දරන 'අඹගමුව කෝරළයේ 2009 වර්ෂයේ රා සහ විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම' යන දන්වීමේ හයවන ජේදයේ ;

'මෙම මුදල මා නමින් ගිනිගත්හේන මහජන බැංකුවේ' යන වැකියේ ඇති 'මා නමින්' යන්න 'ප්‍රාදේශීය ලේකම් නමින්' යනුවෙන් සංශෝධනය විය යුතුය.

ඩබ්. එම්. ගුණවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරලය, ගිණිගත්හේන.

2008 ජූලි මස 31 වැනි දින.

08-896

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**හැටන් නැෂනල් බැංකුව පීඑල්සී - (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව) මහරගම ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරනලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය

නයිවලින් පර්චස් 13.84 ක් විශාල අගනා ඉඩමක්

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, උඩුගහ පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභාවේ වැතර උප කාර්යාල තුළ මත්තේගොඩ පිහිටි මත්තේගොඩවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩබ්ලිව්. ඩී. චන්ද්‍රානි විසින් මැන සාදන ලද 1998 දෙසැම්බර් මස 12 වැනි දින හා අංක 66 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් 1 ලෙස නිරූපිත ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, හා අනෙකුත් සියලු දේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. ඒ. ඩී. ගුණතිලක විසින් සහතික කරන ලද්දාවූ ද, හැටන් නැෂනල් බැංකුව පීඑල්සී නමට ලියන ලද්දාවූ ද, 2003 ජූලි මස 16 වැනි දින හා අංක 792 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල ගෙවීමට අහුලියැද්ද, ලේකම්ලාගේ සමන්සිරි මල්ලිකාරත්න සහ ගමගේ දෝන නිරෝෂා මල්කාන්ති යන අය උකස්කරුවන් හැටියට පැහැර හැර ඇති බැවින් හැටන් නැෂනල් බැංකුව පීඑල්සී විසින් මා වෙත පවරණ ලද බලය මත ඉහත කී දේපළ වර්ෂ 2008 ක් වූ සැප්තැම්බර් මස 10 වැනි දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2007.04.05 දින ශ්‍රී ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයද, 2007.05.23 දින 'ද අයිලන්ඩ්', 'දිවයින' සහ 'තිනකුරල්' යන පුවත්පත් බලන්න.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක් ද (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500ක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 2,000ක් ද වේ. ගැණුම් මිළේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 10 එච්එන්බී ටවර්ස් හි 18 මහලේ කළමනාකරු නීති - අයකිරීම්ගෙන් විමසන්න. දුරකථන අංක : 261815, 2661819 හෝ 4764764 විමසන්න.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777 -672082 ෆැක්ස් : 2871184.

08-738

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (කලින් නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරනලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය

අඹතැන්න බොල්ලේගොඩින් පර්චස් 20.4ක් විශාල අගනා ඉඩමක්

මධ්‍යම පලාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පල්ලේගම්පහ කෝරලේ පාතදුම්බර, ප්‍රාදේශීය සභා සීමාව තුළ බොල්ලේගොඩ අඹතැන්න (මීන්පෙර පරණගම) හි පිහිටි බොල්ලේගොඩ යන නමින් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එච්. එම්. ටී. ආර්. විජේරත්න විසින් සාදන ලද 1996 සැප්තැම්බර් මස 20 දින අංක 896 දරන පිඹුර පරිදි මැන බෙදා වෙන් කළ ලොට් 01 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස.

